සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ආර්ථික විද්‍යාව - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

## 'අ' කොටස

01\. (1) නොදියුණු හා දියුණු සමාජයක පවා හිඟකම මූලික ආර්ථික ප්‍රශ්නයක් බවට පත් වී ඇත. ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(2) 'හිඟකම' ප්‍රශ්නය තුළ තේරීමක් කිරීමට සිදු වී ඇත්තේ කවර සාධක නිසාද? මූලික තේරීම් ප්‍රශ්න කවරේද?

(3) ආර්ථික සම්පත් යන්න පැහැදිලි කරන්න.

(4) සමහර අවස්ථාවලදී ස්වභාවික භාණ්ඩ පවා ආර්ථික භාණ්ඩ වන අවස්ථා දැකිය හැකිය. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(5) නිෂ්පාදන සම්පත් තුළ ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත් ලෙස ඔබ හඳුනාගනු ලබන්නේ කෙසේද? උදාහරණ 2 සපයන්න. (ල. 4 x 5 = 20)

02\. (1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යන්න නිර්වචනය කර ආර්ථික සාධක මට්ටම් ඇඟැයීමේලා නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර යොදාගත හැකි අවස්ථා නම් කරන්න. (ල. 05)

(2) මූලයට අවතල හැඩයක් ගන්නා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පැහැදිලි කර නිෂ්පාදන ක්‍රියාවලියේදී එවැනි තත්ත්වයක් හටගැනීමට හේතු වූ කරුණු නම් කරන්න. (ල. 05)

(3) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇඳ පහත සිදුවීම් ඒ මත ලකුණු කර දක්වන්න. (ල. 2 x 5 = 10)

(i) පූර්ණ සේවා නියුක්ති මට්ටම

(ii) සම්පත් හිඟකම

(iii) ආවස්ථික පිරිවැය සහිත නිෂ්පාදන මට්ටම

(iv) ආවස්ථික පිරිවැය ශූන්‍ය වන අවස්ථාව

(v) ආර්ථික සම්බාධක පැනවීමෙන් පසු ආර්ථිකයේ නිෂ්පාදන මට්ටම පහළ යාම.

03\. (1) ආර්ථික පද්ධතියක් විවිධත්වයකින් යුක්ත වේ. විවිධත්වයක් කෙරේ බලපාන නිර්නායක කවරේද? (ල. 03)

(2) වර්ගකරනු ලබන විකල්ප ආර්ථික පද්ධති කවරේද? (ල. 03)

(3) වෙළඳපල ආර්ථිකයක් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේලා වෙළඳපල යාන්ත්‍රණය ප්‍රශස්ථ මට්ටමක පවතීද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ල. 04)

(4) නූතන ආර්ථික විද්‍යාවට අනුව අසීමාන්තික නිෂ්පාදන සාධක නම් කරන්න. (ල. 04)

(5) මුදල් හා ප්‍රාග්ධනය අතර පවතින වෙනස්කම් දක්වන්න. (ල. 04)

04. මහවැලි සී කලාපයේ වී ගොවීන් සමස්ථ සැපයුමෙන් කුඩා කොටස්කරුවෝ වෙති.

(1) මහවැලි ගොවීන් කුමන වෙළඳපල ව්‍යුහයකට අයත්වේද? (ල. 02)

(2) එමවෙළඳපලේ දක්නට ඇති ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 04)

(3) පූර්ණ තරගකාරී වෙළඳපලක ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍යවූවකි. මෙවැනි වෙළඳපලක පූර්ණ නම්‍ය ඉල්ලුම් ඉල්ලුම් වක්‍රයක් දක්නට ලැබෙන හේතු සාධක පැහැදිලි කරන්න. (ල. 04)

(4) පූර්ණ තරගකාරී වෙළඳපල 'සැපයුම් වක්‍රය' පැහැදිලි කරන්න. (ල. 05)

(5) ආර්ථික ලාභ හා ගණකාධිකරණ ලාභ අතර වෙනසක් පවතීද? පැහැදිලි කරන්න. (ල. 05)

05. (1) ඉල්ලුම් වක්‍රයක් වමේ සිට දකුණට බෑවුම් වන්නේ ඇයි? ඉල්ලුම් ප්‍රමාණයේ හා ඉල්ලුමේ වෙනස අතර පවත්නා වෙනස දක්වන්න. (ල. 03)

(2) ඉල්ලුමේ මිල නම්‍යතාවය තීරණය වන සාධක නම් කරන්න. (ල. 03)

(3) වී සඳහා වෙළඳපල ඉල්ලුම් හා සැපයුම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

$Qd = 70 - 4P \quad Qs = 30 + 4P$

(අ) වී සඳහා වෙළඳපල සමතුලිත මිල හා ප්‍රමාණය සමීකරණය මගින් ගණනය කරන්න. (ල. 04)

(ආ) රජය රු. 8.00 ක සහතික මිලක් ගොවීන්ට ලබාදීමට තීරණය කරනු ලැබුවහොත් වෙළඳපලට සපයන වී ප්‍රමාණය කොපමණද? එම මිල යටතේ ඇති සැපයුම කොපමණද? (ල. 04)

(ඉ) සහතික මිලෙන් පසු මුලු වී සැපයුම වෙළඳපලට පැමිණීමෙන් පසු වෙළඳපල මිල කොපමණද? (ල. 02)

(ඊ) රජය සහතික මිල යටතේ වී මිලදී ගැනීමට තීරණය කරනු ලැබුවේ නම් වී මිලදී ගැනීමට රජයට දැරීමට සිදුවන වියදම කොපමණද? (ල. 02)

(උ) සහතික මිල පැනවීමෙන් පසු රජයට වී සඳහා ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කොපමණද? (ඌණපූරණය) (ල. 02)

'ආ' කොටස

06. (1) ආර්ථිකයක් තුළ හටගනු ලබන "ආර්ථික අවපාතය හා පරිහානිය පැහැදිලි කරන්න. (ල. 04)

(2) ආර්ථිකයක් තුළ දළ දේශීය නිෂ්පාදනය ගණනය කිරීමේදී බහු ගණන දෝශ හා ද්වි ගණන දෝශ වැළැක්වීම සඳහා යොදාගත හැකි විකල්ප ක්‍රම කවරේද? (ල. 02)

(3) සරල ආර්ථිකයක ජාතික ආදායමේ සමතුලිතය ලියා දක්වන්න. (ල. 02)

(4) එක්තරා කල්පිත ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දැක්වේ. එම තොරතුරු ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| රාජ්‍ය අයවැය ශේෂය | රු.මි. | - 250 |
| පරිභෝජන වියදම | රු.මි. | 4,200 |
| ජාතික ආදායම | රු.මි. | 6,200 |
| රජයේ වියදම | රු.මි. | 700 |
| ආනයන වියදම | රු.මි. | 860 |
| අපනයන ඉපයුම් | රු.මි. | 240 |

(අ) රාජ්‍ය බදු ආදායම ගණනය කරන්න. (ල. 04)

(ආ) වැඩිකළ හැකි ආදායම කොපමණද? (ල. 04)

The National e-learning Portal for General Education
sanithAlwis.blogspot.com

(ඉ) ආයෝජනවල වටිනාකම අගයන්න. (ල. 04)

07. (1) ජාතික ආදායම ගණනය කිරීමේදී සංක්‍රාම ගනුදෙනු ඇතුලත් කරනු නොලැබේ. පැහැදිලි කරන්න. (ල. 03)

(2) ඕනෑම ආර්ථිකයකට ජාතික ආදායම් ඇස්තමේන්තු එම ආර්ථිකයේ වැදගත් ඇගැයීම් සාධකයකි. මෙම ප්‍රකාශනය පැහැදිලි කරන්න. (ල. 05)

(3) සමහර වියදම් ඇතුලත් සංරචක කවරේද? (ල. 02)

(4) සරල ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $c = 300 + 0.75\,Y$ වේ.

(අ) ඉතුරුම් සමීකරණය ගොඩනගන්න. (ල. 02)

(ආ) ආදායම රු. 2000 දී ඉතුරුම් මට්ටම ගණනය කරන්න. (ල. 04)

(ඉ) ඉතුරුම් ශුන්‍ය වන ආදායම් මට්ටම කුමක්ද? (ල. 04)

08. (1) පුද්ගලයින් මුදල් ඉල්ලුම් කරනු ලබන්නේ ඇයි? මුදලට ඇති ඉල්ලුම කෙරේ බලපෑමක් සිදුකරනු ලබන සාධක කවරේද? (ල. 04)

(2) අධිබලැති මුදල් හෙවත් පදනම් මුදල්වල ආර්ථිකමය වැදගත්කමක් පවතීද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ල. 04)

(3) වාණිජ බැංකුවක මුදල් මැවීමේ ක්‍රියාවලිය සිදුවීම සඳහා බැංකු පද්ධතියක් තුළ තිබිය යුතු මූලික ලක්ෂණ නම් කරන්න. (ල. 04)

(4) මුදල් සැපයුම අර්ථ දක්වා පුළුල් මුදල් සැපයුමේ අන්තර්ගතය දක්වන්න. (ල. 04)

(5) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු කවරේද? (ල. 04)

09. (1) හුවමාරු කිරීමේ අතරමැදි ඒකකයක් ලෙස මුදලේ කාර්යයන් කවරේද? (ල. 04)

(2) මහ බැංකුව රටේ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තිය කවරේද? ඒ සඳහා යොදාගනු ලබන උපකරණ මොනවාද? (ල. 05)

(3) කල්පිත ආර්ථිකයක වාණිජ බැංකුවක ශේෂ පත්‍රය දැක්වේ. ඒ ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

ශේෂ පත්‍රය

| | | | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 25000 | කාසි සංචිතය | 5500 |
| | | ණය | 19500 |
| | 25000 | | 25000 |

(අ) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% වූයේ නම් බැංකුව සතුව ඇති අධි සංචිත ප්‍රමාණය කොපමණද? (ල. 02)

(ආ) අධි සංචිත පවතින්නේ නම් සැපයිය හැකි ණය ප්‍රමාණය කොපමණද? (ල. 03)

(ඉ) ණය මැවිය හැකි ප්‍රසාරණ සංගුණකය කොපමණද? (ල. 03)

(ඊ) බැංකුවට අධි සංචිත ආශ්‍රයෙන් ආර්ථිකයේ මුදල් සැපයුමට එකතුකළ හැකි මුළු ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය කොපමණද? (ල. 03)

SamithAlwis.blogspot.com

